මගේ අංකය
எனது இல.
My No.

Article 11

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2013/01/22

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

පැමිණිලිකරු : ඩබ්. ගයාන් සමන්ත මයා.
25 කණුව. මංගලගම.
අම්පාර.

වගඋත්තරකරුවන් : 01. මූලස්ථාන පොලිස් පරීක්ෂක.
මූලස්ථාන පොලිස් ස්ථානය.
යාපනය.

02. පො.කො 72796 දයාසිරි මයා.
මූලස්ථාන පොලීසිය.
යාපනය.

පැමිණිලි අංකය : **HRC/AM/10/13**

උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ. තමා පෙදරේරුවෙකු වශයෙන් කටයුතු කරන බවත්. යාපනයේ නාලර් පාර අංක 231. හි එස්. කෘෂ්ණරාජාට අයත් සේවා ස්ථානයේ දෛනික වැටුප් මත සේවයේ නිරතව සිටි බවත්ය. ඒ අසල පිහිටි කාමරයක යාපනය ප්‍රදේශයේ සංචාරයකට පැමිණි කඩවත ප්‍රදේශයේ පුද්ගලයන් නවාතැන් ගෙන ඇති අතර. 2013.01.05 ඔවුන්ගේ රන් බඩු. මුදල් හා කැමරා කිසියම් පුද්ගලයෙකු විසින් සොරගෙන ඇති බවත්. ඒ සම්බන්ධයෙන් යැයි පවසා තමා හා එහි රැඳී සිටි අනෙක් දෙදෙනා 2013.01.05 දින 5.30 ට වගඋත්තරකාර පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත. අත්අඩංගුවට ගැනීම සිදුකරන ලද පො.කො 72796 ඇතුළු නිලධාරීන් තමාට අමානුෂික ලෙස පොලිස් ස්ථානයේදී පහරදී රඳවා තබාගෙන 2013.01.08 දින අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-

පො.කො 72796 දයාසිරි යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ. 2013.01.05 වන දින එච්.පී.ආර් මල්කාන්ති යන අය විසින් පොලිස්

~~අංක 14, ආර්.ඒ.ද මැල් මාවත, කොළඹ 04.~~
இல. 14, ஆர்.ஏ.டி. மெல் மாவத்தை கொழும்பு – 04
ප්‍රධාන කාර්යාලය :- අංක 165, කින්සි පාර, කොළඹ - 08.
தலைமைக் காரியாலயம் :- இல 165, கின்சி வீதி, கொழும்பு - 08.
*Head Office* :- No 165, Kynsey Road, Colombo - 08.
*Tele* : +94 -11- 2694925, 2685980, 2685981
*Chairman* : 2696470
*Secretary* : 2689558
*Hotline* : 2689064
*Fax* : +94 11 2694924
*E-Mail* : sechrc@sltnet.lk
*Web* : www.hrcsl.lk

ස්ථානය වෙත කරන ලද පැමිණිල්ලකට අදාළව ඩබ්. සමන්ත යන අය (පැමිණිලිකරු) සහ තවත් දෙදෙනකු යාපනය පොලිසියේ අපරාධ අංශය මඟින් අත්අඩංගුවට ගෙන ඇති අතර. ඔවුන් අත්අඩංගුවට ගැනීමට විමර්ශන කටයුතු සඳහා හෝ අධිකරණයට ඉදිරිපත් කිරීමේ කටයුතු සඳහා තමන් සහභාගී නොවූ බවත්. ඔවුන්ට තමා පහරදුන් බවට කරන චෝදනාව ප්‍රතික්ෂේප කරන බවද සඳහන් කර ඇත.

මූලස්ථාන පොලිස් පරීක්ෂක. යාපනය පොලිස් ස්ථානය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් දක්වා ඇත්තේ. ඩබ්. සමන්ත යන අය අත්අඩංගුවට ගෙන ඇත්තේ 2013.01.07 දින වන බවත්. ඊට හේතුව රාත්‍රී කාලයේදී නිවසක් බිඳ රු. 3.32.900.00 ක් වටිනා දේපළ සොරකම් කිරීමට සැකපිට බවත්ය. අත්අඩංගුවට ගත් නිලධාරීන් ලෙස උ.පො.ප වික්‍රමාරච්චි. පො.කො 2028 අබේරත්න. පො.කො 83127 චන්දන, පො.කො 85077 වාගීසන්, පො.කො.රි 48108 ජයසිංහ යන නිලධාරීන් සහභාගී වූ බවට දක්වා ඇත. ඔහුට පහරදීමක් සම්බන්ධව කිසිදු පැමිණිල්ලක් ලැබී නොමැති බවද වැඩිදුරටත් සඳහන් කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-

2013.01.05 දින එච්.පී.ආර් මල්කාන්ති යන අය යාපනය පොලිස් ස්ථානය වෙත රුපියල් 3.32.900ක් වටිනා දේපළ සොරකමක් සම්බන්ධයෙන් පැමිණිලි කර ඇති අතර එම පැමිණිල්ලේදී අදාළ නිවස කුලියට ලබා දුන් අය හා එහි සිටි බාස්ලා තුන්දෙනා සැක බවට හේවා දිසානායකගේ ප්‍රියංකා ජිනාදරී ජයවීර යන අය සිය ප්‍රකාශයේදී සටහන් කර ඇති බව අනාවරණය වේ.

පොලිස් ස්ථානයට 2013.01.05 වන දින පැය 5.00 ට බල අපරාධ 105/13 යටතේ ලද රු.3.32.900.00 ක් වටිනා මුදල් හා දේපළ සොරකම් කිරීම සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම පොලිස් වාර්තාවල සඳහන් වී ඇත්තේ 2013.01.07 වන දින පැය 23.50 ට සිදුකර ඇති බවයි.

2013.01.05 වන දින සිට 2013.01.07 දින දක්වා අදාළ අපරාධ සිද්ධිය සම්බන්ධයෙන් සිදුකළ කිසිදු විමර්ශන කටයුත්තක් පිළිබඳ වාර්තා කිසිවක් නොමැති බවද නිරීක්ෂණය වේ.

2013.01.07 වන දින පැය 25.50 ට අත්අඩංගුවට ගත් සැකකරුවන් 2013.01.08 වන දින බී වාර්තා මඟින් අධිකරණයට ඉදිරිපත් කර ඇති අතර. එහිදී බී වාර්තාවේ සැකකරුවන් සිද්ධියට සම්බන්ධ නොමැති බවට විමර්ශන තුළදී අනාවරණය වී ඇති බැවින් සුදුසු ඇපයක් මත සැකකරුවන් මුදා හරින මෙන් ගරු අධිකරණයෙන් පොලිස් නිලධාරීන් ඉල්ලා ඇති බවද නිරීක්ෂණය වේ.

<u>අධිකරණ වෛද්‍ය වාර්තාව :-</u>

2013.01.11 වන දින පැමිණිලිකරු රෝහල්ගත වී ඇති අතර රෝග ඉතිහාසය පිළිබඳව සඳහනේදී ඔහු වෛද්‍යවරයාට කොස්තාපල් දයාසිරි යන අය විසින් විටින් විට දින 03 ක් පහරදුන් බව පවසා ඇති

අතර අදාළ වෛද්‍ය සහතිකයේ මොට ආයුධ භාවිතා කර පහරදීමකින් 'Left side tympanic membrane perforation' ලෙස සඳහන් කර ඇති බව අනාවරණය වේ.

නිගමනය :-

2013.01.05 දින දේපළ සොරා ගැනීමක් පිළිබඳව යාපනය පොලීසිය වෙත පැමිණිල්ලක් ලැබී ඇති අතර. එහිදී කොමිෂන් සභාවට පැමිණිලි කර ඇති ගයාන් සමන්ත ඇතුළු පිරිසක් සැක සහිත බවට අදාළ පැමිණිල්ලේ හේවා දේවගේ ප්‍රියංකා ජිනාදරී ජයවීර යන අය විසින් ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ. එසේ තිබියදී පොලිස් නිලධාරීන් 2013.01.05 දින ලද පැමිණිල්ලේදී සැක සහිත බව දැන්වූ අය පිළිබඳව කිසිදු විමර්ශනයක් සිදු නොකොට 2013.01.07 දින පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවට පොලීසිය කරන ප්‍රකාශයන් අනුව නිරීක්ෂණය වන අතර. සැකකරු සිද්ධියට සම්බන්ධ නොමැති බව විමර්ශනයේදී අනාවරණය වී ඇති බව බී වාර්තාව මඟින් අධිකරණය වෙත 2013.01.08 දින වාර්තා කර ඇති බවද නිරීක්ෂණය වේ. මෙහිදී 2013.01.07 දින පැය 2.30 ට අත්අඩංගුවට ගත්තේ නම් 08 වන දින වන විට සිදුකළ විමර්ශනය කුමක්ද යන්න පිළිබඳව සැක සහිත තත්වයක් මතු වේ. අවම වශයෙන් සැක සහිත අය ප්‍රදේශයෙන් පළා යා හැකි බැවින් ඔවුන් පිළිබඳව විමසීමක් සිදු නොකළේ මක් නිසාද යන සැකයද එහිදී මතු වේ.

ඒ අනුව 2013.01.05 අත්අඩංගුවට ගෙන රඳවා පහරදීමක් සිදුකළ බවට පැමිණිලිකරුවන් දක්වන කරුණු බැහැර කළ නොහැකි අතරම පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට වෛද්‍ය සාක්ෂි මඟින්ද තහවරු වන බවද නිරීක්ෂණය වේ. එයට අදාළ පුද්ගල සාක්ෂි ලබා දෙන ලෙස පැමිණිලිකරුට කිහිප අවස්ථාවකම දන්වා ඇතත් පැමිණිල්ලට අදාළ සාක්ෂි සපයා නොමැත. කෙසේ වුවද පැමිණිලිකරුට පහරදීමක් සිදුව ඇති බවට අධිකරණ වෛද්‍ය වාර්තා සාක්ෂි වී ඇත.

ඉහත කරුණු අනුව වගඋත්තර පාර්ශවීය පොලිස් නිලධාරී පො.කො 72796 දයාසිරි නිලධාරියා උක්ත පහරදීම සිදුකළ බවට ඍජුවම පැමිණිල්ල විසින් ප්‍රකාශ කරන බැවින් දෙවන වගඋත්තරකාර පො.කො 72796 දයාසිරි නිලධාරියා විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති වධහිංසාවෙන් තොරව ජීවත්වීමේ අයිතිය පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බව තහවුරු වේ. එසේම ඔහු අත්අඩංගුවට ගෙන රඳවා තබාගැනීමේ හා පහරදීමේ චෝදනා සම්බන්ධයෙන් යාපනය මූලස්ථාන පොලිස් පරීක්ෂක වෙත ප්‍රතිපුරුෂ වගකීම පැවරෙන බවද කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. එම සිද්ධියට අදාළ අනෙකුත් නිලධාරීන් හඳුනා ගැනීම පැමිණිලිකරු සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් අපහසු වී ඇත.

නිර්දේශය :-

01. දෙවන වගඋත්තරකාර පො.කො 72796 දයාසිරි නිලධාරියා විසින් පැමිණිලිකරු වෙත රු 25,000 ක මුදලක් ගෙවිය යුතුය.

02. මෙහි පිටපත් සුදුසු පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙතද යොමු කරන බවද දන්වා සිටිමි.

2018.02.22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- පොලිස්පතිතුමා,
පොලිස් මූලස්ථානය.
කොළඹ 01.

B/